ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක: 12/2024

මගේ අංකය : HA/05/20/01/01/08/II
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය
"නිල මැදුර", ඇල්විටිගල මාවත,
කොළඹ 05.
2024.12. 18

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
කොමිෂන් සභා ලේකම්වරුන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

ජාතික උප්පැන්න සහතිකය උපත සනාථ කරන මූලික ලියවිල්ලක් ලෙස පිළිගැනීම

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ පනවන ලද 2014 අංක 01 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (ඉ-ජනගහන රෙජිස්ටර) නියෝග අනුව උපතකට අදාළ දත්ත ඉලෙක්ට්‍රොනිකව ගොනු කර ඒ තුළින් ජාතික උප්පැන්න සහතිකය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, 1951 අංක 17 දරන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත යටතේ නිකුත් කර ඇති උප්පැන්න ලේඛනය හා 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ පනවන ලද 2014 අංක 01 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙණු (ඉ-ජනගහන රෙජිස්ටර) නියෝග අනුව නිකුත් කර ඇති ජාතික උප්පැන්න සහතිකය යන ලියවිලි දෙකෙන් කුමන ලියවිල්ලක් වුවද පුද්ගලයෙකුගේ උපත සනාථ කරන මූලික ලියවිල්ලක් ලෙස පිළිගත යුතු බවට මෙයින් දන්වමි.

එස්.ආලෝකබණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය